# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,061 - 2018 මාර්තු මස 02 වැනි සිකුරාදා - 2018.03.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 110 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 මාර්තු මස 23 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 මාර්තු මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය.''

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

109- B 081256 — 353 (2018/03)
D 1 -

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

වැල්ලවාය දිසා අධිකරණයේ දී ය

කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, අංක 75, මහජන බැංකුව

..........................*පැමිණිලිකරු.*

*එදිරිව*

නඩු අංකය - එම්. බී. - 29
ඇස්කීසි අංකය : 02/2018

ලියනආරච්චිගේ පියසේන සහ ලියනආරච්චිගේ රජිත ප්‍රියන්ත - දෙදෙනාම තානායම පාර, තණමල්විල.

...........................*විත්තිකරුවන්.*

වැල්ලවාය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ වර්ෂ 2015.09.03 වැනි දින ප්‍රකාශයට පත්කරන ලද සමථ තීන්දුව ප්‍රකාරව MB28 හා MB29 දරන නඩු සඳහා ඉහත නම් සඳහන් විත්තිකරුවන් විසින් පැමිණිලිකාර බැංකුවට ගෙවීමට ඇති මුළු මුදල රුපියල් තිස් දෙලක්ෂ හැත්තෑ හත්දහස් එකසිය හැත්තෑව (රු. 3,277,170.00)ක් බවත්, සමථයක් ලෙසට එකී මුදලින් 2015.09.25 දින සිට රුපියල් අනූඑක් දහස් පන්සියය (රු. 91,500.00) බැගින් වාරික 04ක් ද, පසුව එළැඹෙන මාසයේ සිට සෑම මසකම 25 වැනි දිනට පෙර රුපියල් හැටහය දහස් පන්සියය (රු. 66,500.00) බැගින් මාසික වාරික හැට අටක් (68) ලෙස ගෙවීමට විත්තිකරුවන් එකඟ වී ඇතත්, එකී මුදල් ගෙවීම විත්තිකරුවන් විසින් පැහැර හැර ඇති බැවින් එකී මුදල අයකර ගැනීම සඳහා මෙම අධිකරණය මගින් නිකුත් කර ඇති ඇස්කීසි ආඥාව ප්‍රකාරව තහනමට ගෙන ඇති මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළෙහි එම විත්තිකරුවන්ට අයත් සියලුම හිමිකම් හා අයිතිවාසිකම්,

වර්ෂ 2018 ක් වූ 03 මස 29 දින පස්වරු 2.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව සියල්ලන්ටම මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් මුළු ගැණුම් මිලෙන් 25% ක මුදලක් ද, පිස්කල් ගාස්තුව ද, රජයට අයවිය යුතු ගාස්තු, තක්සේරු ගාස්තු, වෙන්දේසි ගාස්තු, *ගැසට්* පත්‍රයේ ගාස්තු සහ පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් ද, අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වූ වියදම් එවෙලේම මුදලින් මා වෙත ගෙවිය යුතු ය. චෙක්පත් බාරගනු නොලැබේ. ගැණුම් 75%ක ඉතිරි මුදල දින 30 ක් ඇතුළත වැල්ලවාය දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය.

### උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සිත්තරම් පළාත පත්තුවේ, සිත්තරම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, තණමල්විල නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, මොණරාගල මැණුම් අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජෙනරාල්වරයා විසින් සම්පාදිත, අංක අ.ග.පි. 24 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 432 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම එකයි තුනයි හතරක් (හෙක්. 0.134) විශාල "තණමල්විල මූකලාන" නමැති රජයේ ඉඩමට හතර මායිම්, උතුරට : ප්‍රවේශ මාර්ගය (කැබලි අංක 433) ද, නැගෙනහිරට : ප්‍රවේශ මාර්ග රක්ෂිතය (කැබලි අංක 434) ද, දකුණට : ප්‍රවේශ මාර්ගය (කැබලි අංක 435) ද සහ බස්නාහිරට : කැබලි අංක 431 ඉඩම ද, යන හතර මායිම් තුළ පිහිටි ඉඩම් සහ එහි තුළ පිහිටි වැවිලි ගොඩනැගිලි ඇතුළු සියලු දේත් වේ.

ඉහත ඉඩම බලයලත් මිනින්දෝරු කේ. ඩබ්. එස්. කේ. විකනරාජා මහතා විසින් මැන සාදන ලද අංක 1597 දරන 2009.01.02 දිනැති පිඹුරුපතේ ද පෙන්නුම් කෙරෙන අතර, ලොට් අංක A වශයෙන් සලකුණු කරනු ලැබ පහත පරිදි විස්තර කෙරේ :

ඉහත කී මොණරාගල දිස්ත්‍රික්කයේ තණමල්විල ප්‍රාදේශීය සභා සීමාව තුළ, සිත්තරම් පළාත කෝරළයේ තණමල්විල ගම පිහිටි "තණමල්විල මූකලාන" නමැති ඉඩමට මායිම් : උතුරට : එෆ්. වී. පී. 24 හි ලොට් 433 ද, නැගෙනහිරට : එෆ්. වී. පී. 24 හි ලොට් 434 (ප්‍රධාන පාරේ සිට ඉඩම්වලට දිවෙන පාර) ද, දකුණට : එෆ්. වී. පී. 24 හි ලොට් 435 ද, සහ බස්නාහිරට : එෆ්. වී. පී. 24හි ලොට්

431 ද, යන සතර මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දොළහයි දශම නවයයි අටක් (අක්.00 රූඩ්.01 පර්.12.98) හෙවත් හෙක්ටයාර් බින්දුවයි දශම එකයි තුනයි හතරක් (හෙක්. 0.134) විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ඇතුලු සියලු දේත් වේ.

මෙම ඉඩම මොණරාගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්බීඕ/එම් 131/74 දරන පත්‍රිරුවේ ලියාපදිංචි කර ඇත.

සුනිල් ගලගමගේ,
රෙජිස්ට්‍රාර්/ නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය, වැල්ලවාය.

වර්ෂ 2018ක් වූ පෙබරවාරි මස 02 වැනි දින දී ය.

03-199

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නො-ාමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2018 වර්ෂය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| මාර්තු | 2018.03.02 | සිකුරාදා | 2018.02.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.03.09 | සිකුරාදා | 2018.02.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.03.16 | සිකුරාදා | 2018.03.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.03.23 | සිකුරාදා | 2018.03.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.03.29 | බ්‍රහස්පතින්දා | 2018.03.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2018.04.06 | සිකුරාදා | 2018.03.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.04.12 | බ්‍රහස්පතින්දා | 2018.03.29 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2018.04.20 | සිකුරාදා | 2018.04.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.04.27 | සිකුරාදා | 2018.04.12 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| මැයි | 2018.05.04 | සිකුරාදා | 2018.04.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.05.11 | සිකුරාදා | 2018.04.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.05.18 | සිකුරාදා | 2018.05.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.05.25 | සිකුරාදා | 2018.05.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.).*

2018 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.